නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ හා නව නිපැයුම්
රාජ්‍ය අමාත්‍යාංශය

**NAITA**

**ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය**

# මෙම අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ ජනරාල් තනතුර

### සුදුසුකම් හා පළපුරුද්ද

**බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 01 හෝ 02) :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු / කෘෂිකර්මවේදී / ආර්ථික විද්‍යා / විද්‍යාවේදී / අධ්‍යාපනවේදී / කළමනාකරණවේදී / මානව සම්පත් / මූල්‍ය / ව්‍යාපාර කළමනාකරණ / වානිජවේදී / ගණිත / තාක්ෂණවේදී / රාජ්‍ය පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා තිබීම

**සමග**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංජිනේරු / කෘෂිකර්මවේදී / විද්‍යාවේදී / අධ්‍යාපනවේදී / කළමනාකරණවේදී / මානව සම්පත් / මූල්‍ය / ආර්ථික විද්‍යා / ව්‍යාපාර කළමනාකරණ / රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (Masters) ලබා තිබීම හෝ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක / ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ඉහත විෂය ක්ෂේත්‍රයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක, පශ්චාත් උපාධිය (Masters) සම්පූර්ණ කිරීමෙන් පසු වසර 05 ක් ඇතුළුව අදාළ ක්ෂේත්‍රයේ වසර 18 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

02. පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ඉහත විෂය ක්ෂේත්‍රයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක, පූර්ණ සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු වසර 05 ක් ඇතුළුව අදාළ ක්ෂේත්‍රයේ වසර 18 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 01 හෝ 02 හෝ 03) :**

01. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

02. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ (HM 1-1) අධ්‍යක්ෂ තනතුරක (පුහුණු / තත්ත්ව / සැළසුම් හා අධීක්ෂණ / පරිපාලන හා මානව සම්පත් / මුදල්) වසර (05) ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම.

03. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ කාණ්ඩයේ (AR-2) අධ්‍යක්ෂ / විදුහල්පති තනතුරේ වසර පහක (05) ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප :** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව
රුපියල් 86,865 – 15x2,270 – 120,915 (HM1-3)
(අමතරව රජය මගින් අනුමත ජීවන වියදම් දීමනාව සහ වෘත්තීය දීමනාව සඳහා හිමිකම් ලබයි)
**භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව ප්‍රවාහන පහසුකම් සහ දුරකථන දීමනා සඳහා හිමිකම් ලබයි.**

## අධ්‍යක්ෂ (මුදල්) තනතුර

### සුදුසුකම් හා පළපුරුද්ද

**බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 01 හෝ 02) :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ගණකාධිකරණ / වාණිජ / ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ උපාධියක් ලබා තිබීම

**සමග**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය

**සහ**

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

02. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (CIMA, ICA, ACCA) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ සාමාජිකත්වය

**සමග**

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 01 හෝ 02) :**

01. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

02. මධ්‍යම කළමනාකරණ මට්ටමෙහි (MM 1-1) 1 වන ශ්‍රේණියේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) ක සතුටුදායක සේවය

**වැටුප :** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 (i) අනුව
රුපියල් 80,295 – 15x2,270 – 114,345 (HM 1-1)
(අමතරව රජය මගින් අනුමත ජීවන වියදම් දීමනාව සහ වෘත්තීය දීමනාව සඳහා හිමිකම් ලබයි)
**භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව ප්‍රවාහන පහසුකම් සහ දුරකථන දීමනා සඳහා හිමිකම් ලබයි.**

**වයස් සීමාව :** අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ මුදල් තනතුරු සඳහා වයස අවුරුදු 35–55 අතර විය යුතුය.
**(අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපැවැත්වේ)**

### අදාළ කොන්දේසි :

දැනට රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ දෙපාර්තමේන්තුවල සේවය කරන අය තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම් පත් එවිය යුතුය. ඥාතීන් නොවන ඔබ පිළිබඳ විමසිය හැකි දෙදෙනෙකු ඇතුළත්ව සම්පූර්ණ විස්තර සහිත අයදුම් පතක් තමා විසින් සහතික කරන ලද සහතික වල පිටපත් සමග **2021 ජූලි මස 26 වන දිනට ප්‍රථම සභාපති, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.** නො. 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් විය යුතුය. එසේ නොමැතිනම් naitahrm@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර, කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**සභාපති,**
**ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,**
**නො. 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,**
**වැලිකඩ, රාජගිරිය.**
**දුරකථන 011 2888782-5**

**www.naita.gov.lk**